යම් කිසි වරදක් කාන්තාවන් සහ පිරිමින් යන දෙකොටසම විසින් සිදු කළ අවස්ථාවක වුවද, කාන්තාවගේ වරද වෙත වැඩි බරක් දැමීමේ නැඹුරුතාවක් අපට සමාජයේ ඇතැම් විටෙක දැකිය හැක. එම ආකල්පය පෝෂණය කිරීමට ඇතැම් මාධ්‍ය ඔස්සේ ද රුකුලක් ලැබේ. "කාන්තාවන් දෙදෙනකු ඇතුළු පස් දෙනෙකු සිරභාරයට" වැනි සිරස්තල ඊට නිදසුන් වේ.

2019 හා 2020 වසරවල තෝරාගත් සිංහල භාෂා පුවත්පත් තුළ එසේ කාන්තාව සම්බන්ධයෙන් වන නිෂේධනාත්මක නිරූපණයන් ප්‍රමාණය මෙම දත්ත සටහනින් දැක්වේ. මෙහිදී, 2019 වසරට සාපේක්ෂව ගත් විට 2020 වසරේ එම නිෂේධනාත්මක නිරූපණයන් ප්‍රමාණය වැඩිවී ඇති බවද නිරීක්ෂණය කළ හැක.

අද ලෝක කාන්තා දිනයයි. ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වෙමින් සිදුකරන කොන් කිරීම් නැවැත්වීම කෙරෙහි පාඨක-මාධ්‍ය සැමගේ අවධානය යොමු කළ යුතු බවට සිහිකැඳවීමට යෝග්‍යම දිනයද අදයි.

#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Mawbima #Divaina #Dinamina #SundayLankadeepa #SundayMawbima #SundayDivaina